# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### තුන් වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

### තුන්වන ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**ක්‍රිස්තියානි ධර්මය**

**තුන්වන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| | | ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා<br>මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය |
| | | ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br>විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය<br>අධ්‍යාපන කොමිසම |
| | | ගරු එස්. ඒ. ඒ. ප්‍රනාන්දු පියතුමා, සහකාර කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| අනුමතිය | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය සම්බන්ධීකරණය | : | කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය,<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය :**

| | | |
|---|---|---|
| බාහිර සම්පත් දායකත්වය | : | ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br>විධායක ලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම. |
| | | එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය,<br>ගුරු සේවය, ශාන්ත තෝමස් විදුහල, ගල්කිස්ස |
| | | එම්. පී. සෙල්වනිධි පෙරේරා මිය,<br>ගුරු සේවය (විශ්‍රාමික) |
| | | එම්. අයි. එන්. එෆ්. සේනාරත්න මිය<br>ගුරු උපදේශක, කටාන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයය, |
| | | එස්. පී. සී. ප්‍රනාන්දු මිය,<br>ගුරු සේවය, වෙස්ලි විද්‍යාලයය, කොළඹ 08. |
| | | ඒ. කිතුමිණි සල්ගාදු මිය ,<br>ගුරු සේවය, කටුනායක මහා විද්‍යාලයය, මීගමුව. |
| භාෂා සංස්කරණය | : | ශ්‍රීනාත් ගණේවත්ත මයා<br>(භාෂා සංස්කාරක) |

| | | |
|---|---|---|
| **පරිගණක වදන් සැකසුම** | : | බී. ඒ. එන්. බටවල මිය |
| **විවිධ සහය** | : | ඩබ්ලිව්. එච්. ටී. සිල්වා මයා |
| | | එස්. පී. ඒ. සරත් කුමාර මයා |

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩ නැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එසේ ම යහපත් චර්යාවලට සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරු භවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැප වීම මහත් සේ අගයමු.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
**අධ්‍යක්ෂ,**
**මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම

## ජාතික පොදු නිපුණතා

- සන්නිවේදන නිපුණතා
- පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා
- පරිසරයට අදාළ නිපුණතා
- වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
- ආගම හා ආචාර ධර්මවලට අදාළ නිපුණතා
- ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
- 'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා

## දරුවන් හැඳින ගැනීම

## 1 ප්‍රධාන අවධිය

1 ශ්‍රේණිය | 2 ශ්‍රේණිය

- මව්බස
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

විෂය සමගාමී ක්‍රියාකාරකම්

## 1 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම

## 2 ප්‍රධාන අවධිය

3 ශ්‍රේණිය | 4 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

විෂය සමගාමී ක්‍රියාකාරකම්

## 2 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම

## 3 ප්‍රධාන අවධිය

5 ශ්‍රේණිය

- මව්බස
- ඉංග්‍රීසි
- දෙවන ජාතික භාෂාව
- ගණිතය
- ආගම
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- සිසු ළැදියා හා රුචිකත්ව සඳහා වන වෛකල්ප විෂයයන්

විෂය සමගාමී ක්‍රියාකාරකම්

## 3 ප්‍රධාන අවධියට අදාළ අත්‍යවශ්‍ය නිපුණතා පිළිබඳ ප්‍රවීණතාව තහවුරු කිරීම



# කාලය බෙදා ගැනීම

## දෙවන ප්‍රධාන අවධිය (තුන් වන සහ හතර වන ශ්‍රේණි)

| | **විෂයය** | **සතියකට වෙන් කර ඇති කාලය** |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 5.00 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 6.00 |
| 4. | ඉංග්‍රීසි | පැය 3.00 |
| 5. | දෙවන ජාතික භාෂාව | පැය 1.00 |
| 6. | ආගම | පැය 2.00 |
| 7. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 |
| 8. | විවේක කාලය | පැය 1.40 |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 2.05 |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය **27.30** |

# ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

කිතුනු දරුවකු ගේ ආගමික හැඟීම්වල හරය විය යුත්තේ, ඇදහිල්ල, ප්‍රීතිය හා ක්‍රිස්තුන් වහන්සේට අයත් වීම යි. සියලු යහපත් දේ දෙවි පියාණන් වහන්සේගෙන් ලැබෙන බව දැන ගැනීමෙන් ඇදහිල්ල හා ප්‍රීතිය ජනිත වෙයි. මෙහි දී නිරායාසයෙන් දෙවි පියාණන්ට ස්තුති කිරීමට හා යාච්ඤා කිරීමට යොමු විය යුතු ය. මෙම අරමුණු ප්‍රාථමික අධ්‍යාපන ක්‍රිස්තියානි විෂය නිර්දේශවල අන්තර්ගත වේ. මෙම අරමුණු කෙරෙහි මෙන් ම දේව නිර්මාණ වන අවට පරිසරය සුරැකීම, ආගමික වතාවත්වලට හුරු වීම සහ ආචාර ධර්ම ජීවිතවලට එකතු කර ගැනීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

### ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා

1. දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.
2. දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.
3. දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.
4. ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.
5. ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි.
6. ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.
7. දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.
8. ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

1 - 5 ශ්‍රේණි තෙක් ප්‍රාථමික අවධියේ ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය

සෑම ශිෂ්‍යයකු වෙනුවෙන් ම ක්‍රිස්තියානි ධර්මය පෙළ පොතක් නිකුත් කෙරේ. ගුරු මාර්ගෝපදේශයෙන් බොහෝ ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වීම් කෙරේ. එහි පහත දැක්වෙන ආකාරයේ ප්‍රාථමික සිසුන්ට යෝග්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය ඉදිරිපත් කර ඇත.

- පරිසරය හා සමඟ සම්බන්ධ වූ ප්‍රිය ජනක ක්‍රියාකාරකම් හා ක්‍රීඩා
- ආගමික වතාවත් හා සම්බන්ධ ක්‍රියාකාරකම්
- ගායන, රංගන, රූපණ, නිර්මාණ ආශ්‍රිත ක්‍රියාකාරකම්

### පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ක්‍රිස්තියානි ධර්මය විෂය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතියෙහි මෙම නිපුණතා ගොඩනැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය තෙක් මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයත් මීසම/පළාත/දේවස්ථානය භාර දේවගැති තුමා/තුමිය හෝ ළඟ ම පිහිටි දෙවි මැඳුරක නැතහොත් ආයතනයක දේවගැති තුමා/තුමිය හෝ හමු වීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන අතර ම වාරයකට අවම වශයෙන් දෙවතාවක් වත් දෙවි මැඳුරට සිසුන් කැඳවා ගෙන යාමෙන් දෙවි පියාණන් වහන්සේගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශීර්වාද ඇසුරෙන් ගොඩ නැඟෙන සමානාත්මතාව, සුහදතාව, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර වේ. ඉහත සංස්කෘතියෙහි ලා ක්‍රිස්තියානි ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂයයේ දී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

දින පතා පාසල ආරම්භ කිරීමේ දී හා අවසන් කිරීමේ දී කිතුනු දහමට අනුව සැකැසුණු පාසල් ප්‍රතිපත්තියක් කිතුනු පාසල්වල ක්‍රියාත්මක වේ. මේ හැර එම පාසල්වල විවිධ ආගමික උත්සව හා සම්බන්ධ වැඩසටහන් ද පවතී. එ බැවින් මෙ බඳු පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳ ව ගුරුවරුන් මනා අවබෝධයක් ලබා ගත යුතු ය. එ බඳු වැඩසටහන්වල හා පාසල් ප්‍රතිපත්තිවල දරුවන් රඳවා ගනිමින් විෂය නිර්දේශ මඟින් අපේක්ෂිත නිපුණතා කරා ඔවුන් ළඟා කරවීමට නිරතුරු ව උනන්දු විය යුතු ය.

වෙනත් ආගමික බහුතරයක් සිටින පාසලක වුව ද යාච්ඤාවක් මඟින් හෝ තම ආගම සිහි කර ගැනීමේ අවස්ථාව සලසා දීමෙන් හෝ කිතුනු දරුවන් ගේ අයිතිවාසිකම් තහවුරු වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

**ව්‍යාපෘති නායක**

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| හැඳින්වීම | vi |
| ජාතික අරමුණු | vii |
| මූලික නිපුණතා | viii - ix |
| විෂයමාලා සැලැස්ම | x |
| කාලය බෙදා ගැනීම | xi |
| ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | xii - xiii |
| පටුන | xiv |
| විෂය නිර්දේශය හා ඉගෙනුම් සැලැස්ම | xv |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය | 1 |

# විෂය නිර්දේශය

# හා

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා

# උපදෙස්

# විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන කිතුනු ප්‍රතිපත්ති ඇති ඇදහිලිවන්ත දරුවකු බිහි කිරීම

2. ශුද්ධ බයිබලය යනු දේව වචනය බවට දැනුම්වත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම

3. දෙවි පියාණන් වහන්සේ සමඟ ආත්මික සබඳතාවක් ගොඩනගා ගැනීමට පුරුදු පුහුණු කිරීම

4. ජේසුස් වහන්සේ තම ජීවිතයේ ගැලවුම් කරුවාණන් බව පෙන්වා දීම

5. ශුද්ධාත්මයාණන් වහන්සේ ලෝකය තුළ වැඩ වෙසෙමින් නිරන්තරයෙන් තමාට මඟ පෙන්වතැයි යන විශ්වාසය ගොඩ නැංවීම

6. ශුද්ධ බයිබලයෙන් හමු වන ශ්‍රේෂ්ඨ චරිතවල උදාර ගුණ ජීවිතයට උකහා ගැනීමට මඟ පෙන්වීම

7. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම

8. ස්වභාව ධර්මයෙන් හා තමා අවට ජීවත් වන අය ගෙන් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම

9. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමඟියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම

10. අන්‍යාගම්වලට ද ගරු කරමින් සාමයෙන් හා සහයෝගිතාවෙන් යුතු ව ජීවත් වීමේ වැදගත් ගුණාංග වර්ධනය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා | 1.0 දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි. අගය කරයි. රැකගනියි. | 1.1 දින 6ක් තුළ දෙවියන් වහන්සේ මවා නිම කළ සුන්දර ලෝකය (උත්පත්ති 1 : 1 - 2 : 1) |
| 2.0 දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය | 2.0 දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි. | 2.1 ඥාතීන්ගේ හා අසල්වැසියන්ගේ ආදරය හා රැකවරණය |
| | | 2.2 දේව රැකවරණය - මිසරයට ගිය බිලිඳු ජේසුස් වහන්සේ (ශු. මතෙව් 2 : 13 - 15)<br><br>2.3 දිව්‍ය පෝෂණය - මන්නා හා වටුවෝ (නික්ම යාම 16 : 11 - 15) |
| 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේව ගුණාංග ඇති කර ගැනීම | 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | 3.1 ගුරුවරුන්ගේ ඉගැන්වීම හා දේව සේවකයන්ගේ මඟ පෙන්වීම (1 සාමුවෙල් 3 : 1 - 10) |
| 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගැනීම | 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | 4.1 සාමයේ කුමරා - ගවලෙනක ඉපදීම (ශු. ලූක් 2 : 8 - 16) |
| | | 4.2 සාම පණිවුඩ - කන්ද උඩ දේශනය (ශු. මතෙව් 5 : 8 - 9) |
| | | 4.3 සාමයේ රජු - ජෙරුසලමට රජකු සේ පිවිසීම - තල් අතු පෙරහැර (ශු. ලූක් 19 : 35 - 38) |
| 5.0 ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම | 5.0 ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | 5.1 යාච්ඤා කිරීම - කඳු මුදුන්වල (ශු. මාක් 6 : 46) සාමූහික යාච්ඤාව (ශු. මතෙව් 18 : 19 - 20) |
| | | 5.2 අන් අය වෙනුවෙන් යාච්ඤා (ශු. ජොහාන් 17 : 20 - 21) |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගැනීම | 6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි. | 6.1 ඉවසීම, කරුණාව, යහපත්කම (ශුද්ධාත්ම ඵල) (ගලාති 5:22) |
| 7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම | 7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි. | 7.1 දැහැමි බව - නෝවා (උත්පත්ති - 6 : 9 - 7 : 10) |
| | | 7.2 පරාර්ථකාමී බව - ආබ්‍රහම් හා ලොත් (උත්පත්ති 13 : 8-12) |
| | | 7.3 දේව කැමැත්ත ඉටු කරන නායකත්වය - ජෝෂුවා (ජෝෂුවා 6 : 1 - 6, 20) |
| | | 7.4 ඇදහිල්ල - දානියෙල් (දානියෙල් 6 : 10-23) |
| | | 7.5 යටහත්-පහත්කම - ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීම (ශු. ජොහාන් 13 : 4-9) |
| | | 7.6 කමාවීම - කුරුසි පත් ජේසුස් වහන්සේගේ ප්‍රථම වදන (ශු. ලූක් 23 : 34) |
| 8.0 ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම | 8.0 ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි. | 8.1 ශුද්ධ බයිබලයේ කොටස් 2 හඳුනා ගැනීම (පැරණි හා නව ගිවිසුම) |
| | | 8.2 ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමෙන් ජීවිත ආදර්ශයක් - ජෝසෙප් (උත්පත්ති 50 :15-21) |
| | | 8.3 ශුද්ධ බයිබලයේ නව ගිවිසුමෙන් ජීවිත ආදර්ශයක් - ස්තේපන් (ක්‍රියා 7 : 59 - 60) |
| | | 8.4 ශුද්ධ බයිබලයෙන් දින පතා ජීවිතයට මුතු (2 තිමෝති 3 : 15 - 16) |

## 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**නිපුණතාව** : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි. අගය කරයි. රැක ගනියි.

**ඉගෙනුම් පල** : 1.1

- දෙවියන් වහන්සේ දින 6ක් තුළ ලෝකය මවා නිම කළ බව විශ්වාස කරමින් එක් එක් දිනට අදාළ මැවිලි නම් කරයි.
- දින 6හි මැවිල්ලට අදාළ රූප කපා අලවමින් චිත්‍රය නිම කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1 : 1 - 2 : 1)
- ෆ්ලැනල් පුවරුව සහ රූප
- ලෝකය දින 6කින් මවා නිම කළ බව පෙන්වීමට ලෝක ගෝලය පෙන්වන වෘත්ත හැඩයේ රූපය, කොටස් 6කට බෙදා වෙන් කළ විශාල ප්‍රමාණයේ කඩදාසි පිටපත් කිහිපයක්.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- දෙවියන් වහන්සේ මැවූ ලෝකය ගැන කියවෙන පහත සඳහන් ගීතය අංග චලන සහිත ව ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

1. වත්තේ මල් පිපිලා - හරි ම ලස්සණ යි
   ගහේ ගෙඩි හැදිලා - හරි ම ලස්සණ යි
   වත්තේ මල් පිපිලා - ගහේ ගෙඩි හැදිලා
   බලන බලන හැම පැත්ත ම හරි ම ලස්සණ යි
2. ගඟේ දිය පිරිලා - හරි ම ලස්සණ යි
   මුහුදේ රැළි නැඟිලා - හරි ම ලස්සණ යි
   ගඟේ දිය පිරිලා - මුහුදේ රැළි නැඟිලා
   බලන බලන හැම පැත්ත ම හරි ම ලස්සණ යි
3. කුරුලු රැන් රැන් - හරි ම ලස්සණ යි
   උන්ගේ රූං රූං - හරි ම ලස්සණ යි
   කුරුලු රැන් රැන් - උන්ගේ රූං රූං
   බලන බලන හැම පැත්ත ම හරි ම ලස්සණ යි
4. සොබා දහම පොතකි - හරි ම ලස්සණ යි
   ඒක මැව්ව දෙවිඳු - හරි ම ලස්සණ යි
   සොබා දහම පොතකි - ඒක මැව්ව දෙවිඳු
   බලන බලන හැම පිටුව ම හරි ම ලස්සණ යි

පියවර 2 :

- ශුද්ධ බයිබලයේ උත්පත්ති 1:1 - 2:1 දක්වා කොටස කියවා එය සිසුන්ට විස්තර කරන්න.
- බයිබලයේ සඳහන් අන්දමට දින 6කින් දෙවියන් වහන්සේ ලෝකය මවා නිමකළ අන්දම එක් එක් දිනට අදාළ මැවිලි ෆැනල් පුවරුව මත රූප අලවමින් මැවීමේ කතාව කියා දෙන්න.

1 දවස - 'ආලෝකය වේවා' (ආලෝකයට-දවාල/අන්ධකාරයට - රාත්‍රිය)

2 දවස - 'අහස් කුස වේවා' (අහස)

3 දවස - 'අහස යට තිබෙන ජලය එක තැනකට රැස් වේවා'
(පොළොව, සාගරය, ගස්වැල්)

4 දවස - ඉර, හඳ, තාරකා

5 දවස - ජලජ ජීවීහු සහ පක්ෂීහු

6 දවස - ගව මහීෂයන්, උරගයන්, වන සතුන්, මිනිසා (පුරුෂයා සහ ස්ත්‍රිය ලෙස) මැවීම

පියවර 3 :
- දෙවියන් වහන්සේ දින 6කින් සම්පූර්ණ ලෙස ලෝකය මැවූ බව
- එය ඉතා මනහර ලෙස මවා නිම කළ බව සිසුන්ට අවධාරණය කරන්න.

පියවර 4 :
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- පෙර දින ගෙන ඒමට උපදෙස් දෙන ලද රූප කපා අලවමින් චිත්‍රය සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- 'දින හය තුළ දෙවිඳුන් මැවූ ලෝකය' යනුවෙන් මාතෘකාව ලිවීමට පවසන්න.

**තක්සේරුව :**

- දෙවියන් වහන්සේ ලෝකය මැවීම ගැන අගයමින් මැවිලි ගැන පසසමින් තුති පුදමින් යාච්ඤා කරන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙවියන් වහන්සේ දින 6 තුළ ලෝකය මැවූ බව විශ්වාසයෙන් පිළිගැනීමට යොමු කිරීම.

# 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**නිපුණතාව** : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි.

**ඉගෙනුම් පල** : 2.1

- දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය තම ඥාතීන්ගෙන් හා අසල්වැසියන් ගෙන් ලැබෙන බව විශ්වාස කරමින් ඔවුන් වෙත ප්‍රතිප්‍රේමය දැක්වූ අවස්ථා අත්දැකීම් මඟින් ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** : • පහත සඳහන් රංගනයේ චරිතවලට අදාළ දෙබස් කාණ්ඩ ලියූ කඩදාසි පිටපත්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පෙර සූදානම් කරගෙන තිබූ දෙබස් ලියූ කඩදාසි සිසුන් අතර බෙදා දෙන්න.
- එම දෙබස් අනුපිළිවෙළින් ඉදිරිපත් කිරීමට ඔවුන්ට උපදෙස් දෙන්න.
- භූමිකා රංගනයේ යෙදීමට පහසුකම් සපයා දෙන්න.

වසර අවසාන පාසල් නිවාඩුව ලැබුණු දිනය යි. අවසන් වාර විභාගයේ ලකුණු සමඟ ප්‍රගති වාර්තා පොත් සිසුනට ලැබුණේ අද යි.

සමන් ගෙදර ගොස් නිවසින් බැහැර ව එළිමහනේ ගසක් යට වාඩි වී හඬමින් සිටියි. මේ දැක අසල්වැසි නිවැසියෙක් සමන්ගේ වත්තට පැමිණ විමසයි.

**අසල්වැසියා** : ඇයි සමන් අඬන්නේ . . . ?

**සමන්** : මං කොහොම ද හිනා වෙන්නේ.

**අසල්වැසියා** : ඔය මොකක් ද අතේ තියෙන පොත. (ඔහු එය රැගෙන තොරතුරු විමසයි.)

**සමන්** : මගේ අම්මයි, තාත්තයි බලාපොරොත්තු වුණේ මම හොඳ ලකුණු අරගනියි කියලා. මම පන්තියේ අන්තිමයා.

**අසල්වැසියා** : දුක් වෙන්න එපා පුතා. අපි ලබන අවුරුද්දේ මීට වඩා හොඳට පාඩම් වැඩ කරමු.

(සමන් ගේ අසල්වැසි මිතුරෝ දෙදෙනෙක් ද පැමිණෙති.)

**කණිෂ්ක** : ආ . . . සමන්, අද අපිත් එක්ක සෙල්ලම් කරන්න ආවේ නැත්තේ ඇයි කියලා බලන්නයි ආවේ.

**රුවන්** : රවීන්ද්‍ර මාමත් ඇවිත් ඉන්නේ.

**අසල්වැසියා** : (රවීන්ද්‍ර මාමා) පුතාලා සමන් එක්ක සෙල්ලම් කරනවා වගේ ම, පාඩම් වැඩත් එකතු වෙලා දවසට ටික වෙලාවක් හරි කළොත් හොඳයි.

සමන් මෙදා සැරේ පන්තියේ වාර විභාගයෙන් ලකුණු අඩු වෙලා දුකින් ඉන්නේ. සමන්, අපට පැරදුමක් ලැබෙන්නේ ඊළඟට දිනුමක් ලැබෙන්න යි.

**රුවන්** : ඔව් සමන්, කන්දක් නැග්ගොත් පල්ලමක් ඒ ළඟ ම තියෙනවා. අද ඉඳන් මහන්සි වී පාඩම් වැඩ කරමු.

**අසල්වැසියා** : (රවීන්ද්‍ර මාමා) මට පුළුවනි සති අන්තයේ දිනවල ඕගොල්ලන්ට ගණිතය පාඩම් කියා දෙන්න.

එහා ගෙදර මාලි නැන්දාගෙන් සිංහල විෂයයට උදවු ලබා ගන්න පුළුවනි.

**කණිෂ්ක** : මමත් ඔයා වගේ ම යි. අපි දෙන්න ම හෙට ඉඳන් අලුතින් පාඩම් කරමු.

**සමන්** : අනේ මේ වගේ හොඳ යාළුවන්, අසල්වැසියන් මා වෙතට එවීම ගැන මම දෙවිඳුන්ට ස්තුති කරනවා.

පියවර 2 : • කිහිප දෙනෙකුට ඉදිරියට පැමිණ ඥාතීන් හෝ අසල්වැසියන් හෝ කෙරෙහි ආදරය හා රැකවරණය අත්දුටු අවස්ථාවක් බැගින් විස්තර කරන්න අවස්ථාව ලබා දෙන්න.

- ඔවුන් ප්‍රතිප්‍රේමය දැක්වූ අවස්ථාවක් වේ නම් එය ඉදිරිපත් කිරීමට පවසන්න.

**තක්සේරුව :**

- තමා අසල්වැසියන්ට හෝ ඥාතීන්ට හෝ උදවු කළ අවස්ථාවක් චිත්‍රයට නැගීමට ඉඩ දෙන්න.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එදිනෙදා ජීවිතයේ දී දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකින විට උන් වහන්සේට තුති පිදීමට සහ හැකි අන්දමින් ප්‍රතිප්‍රේමය දැක්වීමට සිසුන් යොමු කිරීම

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

නිපුණතාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි. ප්‍රතිප්‍රේමය දක්වයි.

ඉගෙනුම් පල : 2.2

- බිළිඳු ජේසුස් වහන්සේට දෙවි පියාණන් වහන්සේගේ රැකවරණය ලැබුණු බව පිළිගනිමින් එම සිදුවීම රඟදක්වයි.
- දෙවි පියාණන් වහන්සේගේ අසීමිත ආදරය හා රැකවරණය පිළිබඳ ව තුති දෙමින් යාච්ඤා කරයි.

ඉගෙනුම් සම්පත් : • ශුද්ධ බයිබලය (ශු. මතෙව් 2:13-15))

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

* ජේසුස් වහන්සේගේ උත්පත්තියේ දී ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම
* ශාස්ත්‍රවන්තයන් හෙරොද්ගේ මාළිගයට ගිය බව
* හෙරොද් නැවත ඔවුනට මාළිගයට පැමිණීමට පැවසූ බව
* එහෙත් දේවදූතයා ශාස්ත්‍රවන්තයන්ට වෙනත් මාර්ගයකින් යාමට මඟ පෙන්වූ බව

පියවර 2 : • ශුද්ධ බයිබලයේ මතෙව් 2:13-15 සිසුන්ට ඇසෙන්නට කියවන්න.

* බිළිඳු ජේසුස් වහන්සේ මරා දැමීමට හෙරොද්ට වුවමනා වූ බව,
* එහෙත් දේව දූතයකු ජේසුස් වහන්සේගේ පියා වූ ජෝසෙප්ට සිහිනයකින් දර්ශනය වී මිසරයට පලා යාමට පැවසීම
* දේව අණට කීකරු වී රාත්‍රියේ ම උන් වහන්සේ රැගෙන මිසරයට ගිය බව
* ජේසුස් වහන්සේට දෙවි පියාණන් වහන්සේ රැකවරණය සැපයූ බව
* දෙවි පියාණන් වහන්සේගේ අසීමිත ආදරය හා රැකවරණය අපට ද ලබා දෙන බව

පියවර 3 : • සිසුන් කිහිප දෙනෙකු ඉදිරියට කැඳවා කතාව රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 4 : • දෙවි පියාණන් වහන්සේ අපට ලබා දෙන ආදරය හා රැකවරණය ගැන තුති පුදමින් යාච්ඤාවක් කරන්න.

- ගීතාවලිය 91:11 අභ්‍යාස පොතේ ලියා කටපාඩම් කරන්න.

### තක්සේරුව :

- දෙවි පියාණන් වහන්සේ අපට රැකවරණය ලබා දෙන බව ප්‍රකාශ කරයි. ඒ ගැන තුති පුදමින් යාච්ඤා කරයි.

### ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා

- දෙවි පියාණන්ගේ රැකවරණය එදිනෙදා ජීවිතයේ දී අත්දකින විට උන් වහන්සේට තුති පිදීම.

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**නිපුණතාව** : **දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.3

- දෙවියන් වහන්සේ පාළුකරයේ ගමන් කළ ඉශ්‍රායෙල් ජනතාව ප්‍රාතිහාර්යාත්මක ව මන්නා හා වටුවන් මඟින් පෝෂණය කළ අන්දම විශ්වාස කරමින් සරල ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (නික්මයාම 16 : 11-15)
- මිසරයේ සිට පොරොන්දු දේශය කරා ඉශ්‍රායෙල් ජනතාව මෝසෙස්ගේ නායකත්වයෙන් ගෙන ගිය සිද්ධියට අදාළ රූප පෙළක් හෝ කෙටි වීඩියෝ පටියක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**සමාජීය පවුල**

පියවර 1 :
- ඉශ්‍රායෙල් ජනයා මිසරයේ වහල්කමින් මිදී මිසරයේ සිට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු දේශය කරා යාමේ සිද්ධිය පිළිබඳ කතාව පිළිබඳ වීඩියෝ පටිය හෝ රූප පෙළ හෝ පෙන්වන්න.
- ඒ ඇසුරෙන් කෙටි සාකච්ඡාවක යෙදෙන්න.

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ නික්මයාම 16 : 11 - 15 සිසුන්ට ඇසෙන සේ කියවන්න.
  - * පාළුකරයේ මෙසේ ගමන් කිරීමේ දී ඉශ්‍රායෙල් ජනයාට නොයෙක් දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වූ බව ද,
  - * විටෙක ආහාර නැති වූ බව ද,
  - * එවිට ඉශ්‍රායෙල් ජනතාව මැසිවිලි කී බව ද පවසන්න.

පියවර 3 :
- දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට සවස් කාලයේ වටුවන් මඟින් ද,
  - * උදය කාලයේ දී මන්නා මඟින් ද,
  - * ප්‍රාතිහාර්යාත්මක ව පෝෂණය ලබා දුන් අන්දම පෙන්වා දෙන්න.
  - * මන්නා ඉශ්‍රායෙල් ජනතාව නොදත් බවත්,
  - * ඒ ගැන ඔවුන් මෝසෙස් ගෙන් ප්‍රශ්න කළ බවත්,
  - * සමිඳාණන් වහන්සේ ජනතාවට අනුභව කිරීමට දුන් ආහාරය මෙය බව මෝසෙස් පහදා දුන් බවත් පවසන්න.

පියවර 4 :
- ඉශ්‍රායෙල් ජනතාව මැසිවිලි කී නමුත් දෙවියන් වහන්සේ පාළුකරයේ දී පෝෂණය කළ බව
- අද ද උන්වහන්සේ අප පෝෂණය කරන බව අවධාරණය කරන්න.

පියවර 5 :
- වාචික ප්‍රශ්න කිහිපයක් අසන්න. (ඇමුණුම)
- අපේ දින පතා භෝජනය සපයා දෙන දෙවි පියාණන් වහන්සේට තුති පුදමින් යාච්ඤාවක් ඔප්පු කරන්න.

**තක්සේරුව :**

- දෙවියන් වහන්සේ පාළුකරයේ ගමන් කළ ඉශ්‍රායෙල් ජනතාව ප්‍රාතිහාර්යාත්මක ව මන්නා හා වටුවන් මඟින් පෝෂණය කළ සිද්ධියට ආශ්‍රිත ව වාචික ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- මූලික අවශ්‍යතා නොමැති දරුවන් වෙනුවෙන් යාච්ඤා කිරීමට යොමු කිරීම.

**ඇමුණුම**

1. ඉශ්‍රායෙල් ජනයාට මිසරයේ සිට පොරොන්දු දේශය කරා ගමන් කිරීමේ දී මුහුණ පෑ දුෂ්කරතා මොනවා ද ?
2. ඔවුන් මැසිවිලි කීවේ කාට විරුද්ධ ව ද ?
3. දෙවියන් වහන්සේ ඔවුන්ට සැපයුවේ මොනවා ද ?

   උදය කාලයේ දී -

   සවස් කාලයේ දී -

## 3.0 තේමාව : දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේව ගුණාංග ඇති කර ගැනීම

**නිපුණතාව** : **දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.**

**ඉගෙනුම් පල** : 3.1

- යහපත් කිතුනුවන් ලෙස දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනිමින් සාමුවෙල්ට දෙවියන් වහන්සේ කතා කිරීමේ සිදුවීම චිත්‍රයට නගයි.
- ජීවිතයට ගුරුවරුන්ගේ ඉගැන්වීම හා දේව සේවකයන්ගේ මඟ පෙන්වීම ලබා ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් ලබා ඇති එවැනි අත්දැකීමක් පන්තිය ඉදිරියේ බෙදා ගනියි.

**ඉගෙනුම් සම්පත්** : • ශුද්ධ බයිබලය (සාමුවෙල් 3:1-10)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 : • ක්‍රිස්තියානි ගීතිකා පොතේ 555 ගීතිකාවේ මුල් පදය හෝ ඒ හා සමාන වෙනත් ගීතයක් හෝ සිසුන් සමඟ ගායනා කරන්න.

ක්‍රිස්තියානි ගීතිකා 555

හිමියෙනි කතා කරන් - ඔබ මෙහෙකරුට
යොමු ව ඇත මගේ කන් - ඔබ හඬ අසන්ට
කතා කරන් ස්වාමිනේ - කිම් ද ඔබ කියන්නේ

පියවර 2 : • ශුද්ධ බයිබලයේ 1 සාමුවෙල් 3 : 1-10 දක්වා කොටසින්, 1 සාමුවෙල් 3 : 1-2 කොටස කියවන්න.

* එය දෙවියන් වහන්සේගේ දර්ශන විරල වූ කාලයක් වීම
* ඒලී පූජකයා වයසට ගොස් සිටීම
* ඒලී වයස්ගත ව සිටිය ද සතුටින් තම සේවයේ නොකඩවා යෙදී සිටිය බව

පියවර 3 : • ශුද්ධ බයිබලයේ 1 සාමුවෙල් 3 : 3-10 දක්වා කොටසේ කතාව සිසුන්ට කියා දෙමින්, පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.

* දෙවියන් වහන්සේ තුන් වතාවක් සාමුවෙල්ට කතා කළ බව ද,
* සාමුවෙල් එවිට කළ යුතු දේ නොදැන ඒලී පූජකයා වෙත ගොස් විමසූ බව ද පවසන්න.
* ඒලී නිවැරදි මඟ පෙන්වීම දුන් බව ද
* ඒලී ඉගැන්වූ අන්දමට සාමුවෙල් පිළිතුරු දුන් බව ද
* ඒ අනුව ක්‍රියා කිරීමෙන්, දෙවියන් වහන්සේ සමඟ කතා කිරීමට කුඩා සාමුවෙල්ට අවස්ථාව ලැබුණු බව

පියවර 4 : • තම ජීවිතයට ගුරුවරු හා දේව සේවකයන්ගේ මඟ පෙන්වීම ලබා ගත යුතු බව
• ඒ මඟ පෙන්වීම්වලින් තම ජීවිතය ආලෝකවත් කර ගත හැකි බව ද පෙන්වා දෙන්න.

පියවර 5 : • එවැනි අත්දැකීම් සිසුන්ට ඇත්නම් අන් සිසුන් ඉදිරියේ තම අත්දැකීම බෙදා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
• සාමුවෙල්ට දෙවියන් වහන්සේ කතා කළ සිදුවීම චිත්‍රයට නැඟීමට මඟ පෙන්වන්න.

**තක්සේරුව :**

- තම ජීවිතයට ගුරුවරුන්ගෙන් හා දේව සේවකයන්ගෙන් ලැබුණු මඟ පෙන්වීම ලබා ගැනීමේ වැදගත්කම පිළිගනිමින් එවැනි අත්දැකීම් ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එදිනෙදා ජීවිතයේ දී ගුරුවරුන් හා දේව සේවකයන් මඟින් දේව ඉගැන්වීම හා මඟ පෙන්වීම ලබා ගැනීමට යොමු කිරීම.

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.1

- 'සාම කුමරුන්' වූ ජේසුස් වහන්සේ ගව ලෙනෙහි ඉපදුණු බව පිළිගනිමින් එතුමන් ලොවට ගෙන ආ සාමය 'සාම පැතුමින්' එකිනෙකාට ප්‍රකාශ කරයි.
- ගව ලෙනක ඉපදුණු සාම කුමරුන් තම ජීවිතයට පිළිගනිමින් නත්තල් පතක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ලූක් 2 : 8 - 16)
- බ්‍රිස්ටල් බෝඩ්
- නත්තල් පත නිර්මාණයට අවශ්‍ය දෑ
- පාට පැන්සල්, ප්ලැටිග්නම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- ලූක් 2 : 8-16 දක්වා බයිබල් කොටස සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- ජේසු කුමරුන් ගවලෙනක ඉපදීම දැක්වෙන පින්තූර පතක් දරුවන්ට පෙන්වන්න.
- එම ගව ලෙනෙහි ඉපදුණු ජේසු කුමරුන් මුළු ලොවට ම සාමය ගෙන ආ, ජේසුස් වහන්සේ බව දරුවන්ට පැහැදිලි කරන්න.

පියවර 2 :

- දේව දූතයන් දෙවිඳුන්ට ප්‍රශංසා කළ අයුරු දරුවන්ට පහදා දෙන්න.
- ශු. ලූක් 2 : 14 පදය කීප වරක් දරුවන් ලවා උච්චාරණය කරන්න.
- 'සාම පැතුමෙහි' වැදගත්කම හා ඒ පිළිබඳ ව දරුවන්ට පහදා දෙමින් 'සාම පැතුමෙන්' එකිනෙකාට සාමය පැතීමට යොමු කරවන්න.

පියවර 3 :

- ගව ලෙනක ඉපදුණු සාම කුමරුන්ගේ උපත දැක්වෙන නත්තල් කාඩ් පතක් නිර්මාණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දෙන්න.
- නත්තල් කාඩ් පත නිර්මාණයට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව :**

- සාම කුමරුන් ලොවට ගෙනා සාම පණිවිඩය ප්‍රකාශ වන නත්තල් පතක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එකිනෙකා සමඟ සාමයෙන් ජීවත් වීමට යොමු වීම.

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.

**ඉගෙනුම් පල** : 4.2

- ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් ලෙස හඳුනා ගනිමින් එදිනෙදා ජීවිතයේ දී එකිනෙකා සමඟ සාමයෙන් කටයුතු කළ අවස්ථා නම් කරයි.
- සාමයේ කුමාරයාණන් වූ ජේසුස් වහන්සේ අනුගමනය කරමින් ශු. මතෙව් 5 : 9 බයිබල් පාඨය වර්ණවත් පොත් සලකුණක් මගින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ශු මතෙව් 5 : 9)
- පොත් සලකුණ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය
- බ්‍රිස්ටල් බෝඩ්
- පාට පැන්සල්
- ප්ලැටිග්නම්
- පීත්ත පටි (රිබන්)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- ජේසුස් වහන්සේ සාම කුමාරයණන් බව සිසුන්ට හඳුන්වා දෙන්න.
- ගැටුම්කාරී අවස්ථාවක දී ගුරුතුමිය සාමයෙන් කටයුතු කළ අවස්ථාවක් ස්ව අත්දැකීමක් සමඟ සිසුන් සමඟ බෙදා ගන්න.

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ මතෙව් 5 : 9 සිසුන්ට ඇසෙන පරිදි කියවන්න.
  - පහත කරුණු ඉස්මතු කර ගන්න.
  - * කන්ද උඩ දේශනය මඟින් සාමය ඇති කිරීමෙහි වැදගත්කම උන් වහන්සේ අවධාරණය කළ බව
  - * කන්ද උඩ දේශනය මඟින් සාමය ඇති කිරීමට උන් වහන්සේ අපට ආරාධනා කරන බව
  - * සාමය ඇති කරන්නෝ දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස ජේසුස් වහන්සේ හඳුන්වා දී ඇති බව

පියවර 3 :
- අපගේ එදිනෙදා ජීවිතයේ දී එකිනෙකා සමඟ සාමයෙන් කටයුතු කළ අවස්ථා පැවසීමට එක් එක් සිසුවාට අවස්ථාව ලබා දෙන්න.
- ශු. මතෙව් 5.9A යන බයිබල් පාඨය යොදා ගනිමින් වර්ණවත් පොත් සලකුණක් සෑදීමට අවශ්‍ය සම්පත් සිසුන්ට ලබා දෙන්න.
- අලංකාර පොත් සලකුණක් නිර්මාණය කරවන්න.
- එක් එක් සිසුවා විසින් නිර්මාණය කරන ලද පොත් සලකුණ පන්තියේ යහළුවකු සමඟ හුවමාරු කර ගැනීමට සලස්වන්න.
- එසේ හුවමාරු කරගත් පොත් සලකුණ සිය බයිබලය තුළ රැඳවීමට මඟ පෙන්වන්න.

**තක්සේරුව :**

- බයිබල් පාඨය ලියූ වර්ණවත් පොත් සලකුණක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එකිනෙකා සමඟ සාමයෙන් ජීවත් වීමට යොමු වීම

# 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.3

- ජේසුස් වහන්සේ සාමයේ රජු ලෙස කොටළුවකු මත ජෙරුසලමට පිවිසුණ බව වටහා ගනිමින් එම සිදුවීම රංගනයකින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ලූක් 9.35 - 38)
- තල් අතු හෝ ඊට ආදේශනයක්
- කොටළුවකුගේ හිසෙහි ආකෘතියක්
- බිම ඇතිරීමට වස්ත්‍ර
- රංගාභරණ
- කිතුනු ගීත පොතේ ගීතිකා අංක 121 - 'තල් අතු ගෙනතින සේසත් දරමින' යන ගීතිකාව හෝ ඊට සමාන වෙනත් ගීතිකාවක්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සියලු සිසුන්ට ඇසෙන සේ බයිබල් පාඨය කියවන්න. ශු. ලූක් 9 : 35 - 38 පහත සඳහන් දෑ ඉස්මතු කරගන්න.
  * ජේසුස් වහන්සේ සාමයේ රජු බව
  * සාම කුමරුන් වූ ජේසුස් වහන්සේ කොටළු නාම්බකුගේ පිට රජකු සේ ගමන් ගත් බව
  * මිනිසුන් තම උතුරු සළු ඒ මත ගලවා ඌ පිට අතුරා ජේසු තුමා ඒ මත හිඳවූ බව
  * මඟ දෙපස සිටි ජනයා තමන්ගේ සළු එතුමන් පිළිගැනීමට බිම එළා ලූ බව
  * උන් වහන්සේගේ ගෝලයන් ද 'සමිඳුන් නමින් වඩිනා රජු හට ආසිරි වේවා' යි කියමින් එතුමන්ට ප්‍රශංසා කළ බව
- සිසුන්ගේ අදහස් විමසමින් ජේසුස් වහන්සේ කොටළුවකුගේ පිට නැඟ ජෙරුසලමට පිවිසීමේ සිදුවීම පහදා දෙන්න.

පියවර 2 :

- සාමයේ රජුන් පිළිගනිමින් පහත දැක්වෙන ගීතිකාවේ පළමු පදය සිසුන් සමඟ ගායනා කරන්න.

තල් අතු ගෙන'තින
සේසත් දරමින
මහ මඟ සරසාලා
බුහුමන් පුදමින
තුති ගොස නගමින
යමු යමු පිය නඟලා
ජෙරුසලම් පුර
දෙව් මැඳුරට හිමි
ගිය හැටි සිහි කරලා
තුති ගී නගමින
හිමි ගුණ වනමින
යමු යමු බෙර වයලා

පියවර 3 :

- ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පිවිසීමේ සිදුවීම රංගනයකින් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ඇඳුම් පැලඳුම් සහ තල් අතු හෝ ඊට ආදේශනයක් හෝ රැගෙන ඒමට උපදෙස් ලබා දෙන්න.
- කලින් උපදෙස් දී ඇති පරිදි ජේසුස් වහන්සේ රාජ තේජසින් ජෙරුසලමට පිවිසීමේ සිදුවීම රංගනයකින් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරුව :**

- ජේසුස් වහන්සේ රජකු සේ ජෙරුසලමට පිවිසීමේ සිදුවීම රංගනයකින් ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- මෙලොවට වැඩියා වූ සාම රජාණන් වූ ජේසුස් වහන්සේ පිළිගනිමින් එතුමන්ට ප්‍රශංසා කරමින් එකිනෙකා සමඟ සාමයෙන් ජීවත් වීමට යොමු වීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම

**නිපුණතාව** : **ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම.**

**ඉගෙනුම් පල** : 5.1

- අප කරන පෞද්ගලික සහ සාමූහික යාච්ඤාවට දෙවියන් වහන්සේ පිළිතුරු දෙන බව දේව වචනය මඟින් උගනිමින් පෞද්ගලික ව සහ සාමූහික ව යාච්ඤා කරයි. (යාච්ඤාවේ නිරත වෙයි.)

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ වූ බයිබලය (ශුද්ධ මාර්ක් 6:46, ශුද්ධ මතෙව් 18:19-20)
- ජේසුස් වහන්සේ කඳු මුදුනක තනි ව යාච්ඤා කරමින් සිටින පින්තූරයක්
- සාමූහික ව යාච්ඤා කරන අවස්ථාවන් ඇතුළත් රූප පෙළක්
- අප සාමූහික ව යාච්ඤා කළ යුතු අවස්ථාවන් ලියා දක්වන ලද කුඩා බ්‍රිස්ටල් බෝඩ් පුවරු

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- පාසල් වත්තේ සුදුසු ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- 'දින පතා දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරන ළමයින් අත් ඉහළට ඔසවන්න' යනුවෙන් ප්‍රශ්න කරමින් එම දරුවන් අගය කරන්න.
- ජේසුස් වහන්සේ කඳු මුදුනක තනි ව යාච්ඤා කරමින් සිටින පින්තූරය ප්‍රදර්ශනය කර, ශුද්ධ බයිබලයේ මතෙව් 6 : 46 වන පදය ශබ්ද නඟා කියවන්න.
- පින්තූරය හා බයිබල් පදය පිළිබඳ ව විමසමින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ජේසුස් වහන්සේ ද තම පියාණන් වහන්සේට තනි ව යාච්ඤා කළ බව පහදා දෙන්න.
- සෑම සිසුවකුට ම පෞද්ගලික ව යාච්ඤා කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 :

- සාමූහික ව යාච්ඤා කරන දර්ශනය සහිත චිත්‍ර පෙළක් සිසුන් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.

  *උදා* : 1. පාසල ආරම්භක අවස්ථාවක්
  2. උපන් දින අවස්ථාවක්
  3. රෝගී වූ අයකු වෙනුවෙන්

- සිසුන්ට ඇසෙන පරිදි ශුද්ධ මතෙව් 18:19-20 බයිබල් කොටස කියවන්න.
- බයිබල් කොටස පහදා දෙමින් පහත කරුණු ඉස්මතු කර ගන්න.

  * දෙදෙනකු හෝ තුන් දෙනකු එකඟ වී එක් ව කරන යාච්ඤාවක් සාමූහික යාච්ඤාවක් වන බව
  * අප කරන යාච්ඤා ජේසුස් මහන්සේගේ නාමයෙන් පුද කළ යුතු බව
  * ජේසුස් වහන්සේගේ නාමයෙන් අප රැස් වන කළ, උන් වහන්සේ ද, අප මැද (මධ්‍යයේ) රැස් ව සිට අප කරන යාච්ඤාවට පිළිතුරු දෙන බව
  * අප එදිනෙදා සාමූහික යාච්ඤාවට යොමු විය යුතු බව

පියවර 3 :
- ඉගෙනුම් සම්පත් සඳහා යොදා ගන්නා රූප පෙළේ අප සාමූහික ව යාච්ඤා කරන අවස්ථාවන් හැරුණු විට, සාමූහික ව යාච්ඤා කළ හැකි වෙනත් අවස්ථා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සාමූහික ව යාච්ඤා කළ හැකි එවැනි අවස්ථාවන් සඳහා හඬ නගා යාච්ඤා කිරීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරුව :**

- හඬ නගා සාමූහික ව යාච්ඤාවේ යෙදෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙවියන් වහන්සේට දින පතා පෞද්ගලික ව යාච්ඤා කරයි.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම

**නිපුණතාව** : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම.

**ඉගෙනුම් පල** : 5.2

- ජේසුස් වහන්සේ අන් අය උදෙසා කළ යාච්ඤාවෙන් මඟ පෙන්වීමක් ලබමින් තම දේවස්ථානයේ මිතුරු-මිතුරියන් පිළිබඳ ව යාච්ඤා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ශු. ජොහාන් 17:20)
- රිජිෆෝම් පුවරුව
- ජේසුස් වහන්සේ යාච්ඤා කරමින් සිටින පින්තූරයක්
- ගම්/රැඳවුම් කටු
- අන් අය වෙනුවෙන් යාච්ඤා කළ හැකි විවිධ අවස්ථා සහිත පින්තූර පත්
  *උදා :* උපන් දින අවස්ථාවක්, අසරණ වූ පවුලක් වෙනුවෙන්, තම පාසල පිළිබඳව, තම අසල්වාසීන් දැක්වෙන පින්තූරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- කිතුනු දරුවන් වන අපට අප ගැන මෙන් ම අන් සැම ගැනත් විශාල වගකීමක් ඇති බව සිසුන්ට වටහා දෙමින්, ඔවුන් වෙනුවෙන් අප යාච්ඤා කළ යුතු බවට සිසුන්ට අවධාරණය කරන්න.
- දරුවන් ඉදිරියේ අන් අය වෙනුවෙන් කරන යාච්ඤාවක් ඔප්පු කරන්න.
- පෙර තමා පුද කළ යාච්ඤාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 :

- ජේසුස් වහන්සේ දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරන අවස්ථාවක් දැක්වෙන පින්තූරයක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ශු. බයිබලයේ ශු. ජොහාන් 17:20 වන පදය සියලු සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කර ගන්න.
  * ජේසුස් වහන්සේ යාච්ඤා කළ බව
  * මෙහි දී ජේසුස් වහන්සේ තම ගෝලයන් ගැන යාච්ඤා කළ බව
  * එම ප්‍රකාශ කරන දේව වචනය කරණ කොට ගෙන ජේසුස් වහන්සේ අදහාගන්නා සියලු ඇදහිලිවතුන් ගැන ද ජේසුස් වහන්සේ යාච්ඤා කරන බව ද,
  * ජේසුස් වහන්සේ අන් අය උදෙසා කළ යාච්ඤාව අප සැමට මඟ පෙන්වීමක් ලබා දෙන බව

  සිසුන්ට පහදා දෙන්න.

පියවර 3 :

- දරුවන්ට අන් අය වෙනුවෙන් යාච්ඤා කිරීමේ ඇති වැදගත්කම පහදා දෙන්න.
- අන් අය වෙනුවෙන් යාච්ඤා කළ හැකි විවිධ අවස්ථාවන් දැක්වෙන චිත්‍ර පෙළක්/පින්තූර පෙළක් රිජිෆෝම් පුවරුවක් මත ප්‍රදර්ශනය කරන්න.
- එම එක් එක් අවස්ථාව ගැන විමසමින් ඔවුන් පිළිබඳ ව අප යාච්ඤා කළ යුතු බව සිසුන්ට පහදා දෙන්න.
- තම දේවස්ථානයේ මිතුරු-මිතුරියන් පිළිබඳ ව යාච්ඤා කිරීමට සිසුන් යොමු කරවන්න.

**තක්සේරුව :**

- දේවස්ථානයේ තමන්ගේ මිතුරු-මිතුරියන් පිළිබඳ ව යාච්ඤා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ජේසුස් වහන්සේ මෙන් අන් අය පිළිබඳ ව යාච්ඤා කිරීමට යොමු වෙයි.

## 6.0 තේමාව : ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගැනීම

නිපුණතාව : ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.

ඉගෙනුම් පල : 6.1

- දෙවියන් වහන්සේට අයත් දරුවකු වීමෙන් ඉවසීම, කරුණාව හා යහපත්කම ජීවිතයෙන් ප්‍රකාශ වන බව වටහා ගනියි.
- එම ගුණාංග ශුද්ධාත්මයාණන් සමඟ ජීවත් වීමෙන් ලැබෙන බව අවබෝධ කර ගනිමින්, තම ජීවිතයෙන් ඒවා ඉස්මතු වූ අවස්ථාවක් ප්‍රීතිමත් ව ඉදිරිපත් කරයි.

ඉගෙනුම් සම්පත් :

- ශුද්ධ බයිබලය, ගලාති 5 : 22
- අසරණ, අනාථ, වැඩිහිටි අය රැක බලා ගන්නා අවස්ථාවන් පෙන්වන කිතුනු නිවාසයක චිත්‍රයක්
- 'ඉවසීම, කරුණාව, යහපත්කම' යන වචන ලියන ලද පුවරුවක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- 'කිතුනු නිවාසයක' ආදරය සෙනෙහස කැපී පෙනෙන ලෙස සකස් කළ චිත්‍රය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ ව සිසුන්ගෙන් අදහස් විමසන්න.
  - * එහි අනාථ අසරණ වයසක පුද්ගලයන් නේවාසික ව සිටින බව
  - * එහි සේවය කරන අය ඉතා දයාවෙන්, සැලකිල්ලෙන් ඔවුන් රැක බලා ගන්නා බව

පියවර 2 :

- ශුද්ධ බයිබලයෙන් ගලාති 5:22 පදය සිසුන්ට ඇසෙන ලෙස කියවන්න.
- බයිබල් පාඨයේ කොටස් සඳහන් පුවරුව ඉදිරිපත් කරමින් එම වචන ශබ්ද නඟා කියන්නට සලස්වන්න.
- පහත කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
  - * එම ගුණාංගයන් ශුද්ධාත්මයාණන් ජීවිතයට ලබා දෙන පල බව
  - * මෙම ශුද්ධාත්ම පල සහිත ව ජීවත් වීමෙන්, තමා අවට වෙසෙන අය ප්‍රීතිමත් කළ හැකි බව
  - * දෙවියන් වහන්සේ එසේ ජීවත් වීම බලාපොරොත්තු වන බව

පියවර 3 :

- ශුද්ධාත්ම පල ජීවිතයෙන් ඉස්මතු වූ අවස්ථාවන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්නට ඉඩ සලස්වන්න.
- ඒ ගැන දිරිමත් කරමින් යාච්ඤාවක් පුද කරන්න.

### තක්සේරුව :

- ඉවසීම, කරුණාව හා යහපත්කම යන ශුද්ධාත්ම පල තමා තුළ ඉස්මතු වූ අවස්ථාවන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරයි.

### ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා

- ඉවසීම, කරුණාව හා යහපත්කම නමැති ශුද්ධාත්ම පල නිරතුරු ව ම ජීවිතයෙන් දරන්නට යොමු වීම.

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

නිපුණතාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

ඉගෙනුම් පල : 7.1

- දෙවියන් වහන්සේ නෝවාගේ දැහැමි බව අගය කර ඔහු ඇතුළු පවුලේ සැම ආරක්ෂා කිරීමට ක්‍රියා කළ බව පිළිගනිමින් නෝවාගේ නැවේ ආකෘතිය සාමූහික ව නිර්මාණය කරයි.

ඉගෙනුම් සම්පත් :

- ශුද්ධ බයිබලය (උත්පත්ති 6 : 9 - 7 : 10)
- බ්‍රිස්ටල් බෝඩ්වලින් තනා ගත් නැවේ ආකෘතිය
- අයිස්ක්‍රීම් කෝටුවල සවි කර ගත් පිරිමි හා ගැහැනු සත්ත්ව රූප යුගල බැගින්
- ගම්, යෝගට් කෝප්ප, වැලි
- නෝවා දැක්වෙන අත් රූකඩයක්
- නෝවා හා පවුලේ අය දැක්වෙන රූප

මාතෘකාව : දැහැමි බව

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- නෝවා හා පවුලේ අයගේ චිත්‍රයක් පෙන්වා සිසු අදහස් විමසීම

පියවර 2 :
- සිසුන්ට ඇසෙන සේ තෝරාගත් බයිබල් පද උත්පත්ති 6 : 9, 6 : 13, 7: 6-10 කොටස් කියවන්න.
- බ්‍රිස්ටල් බෝඩ්වලින් තනාගත් නැවේ ආකෘතිය පන්තිය තුළ තබන්න.
- බයිබල් කොටස අනුව කතාව රසවත් ව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පහත කරුණු ගැන අවධානය යොමු කරන්න.
  - * නෝවා දැහැමි බව, දේව කැමැත්තට අවනත වූ බව
  - * ඔහු සත්ගුණවත් බව
  - * දෙවියන් වහන්සේ සුහද ව හැසුරුණු බව
  - * දේව නියමය අනුව නැව නිර්මාණය කළ බව
  - * ගැහැනු පිරිමි වශයෙන් සතුන් දෙදෙනා බැගින් නැවට ගෙන ගිය බව
  - * එහිදී නෝවා ඇතුළු පවුලේ සැම ද සතුන් යුගල ද නෝවාගේ දැහැමි බව නිසා රැකවරණය අත්දුටු ආකාරය

පියවර 3 :
- සිසුන් කණ්ඩායම්ගත කරන්න.
- ගුරුවරයා විසින් කතාවට අදාළ කරගත් සත්ත්ව රූප බෙදා දෙන්න.
- සියලු ම රූප වැලි පුරවන ලද යෝගට් කෝප්පවල රැඳවීමට සලස්වන්න.
- ඒවා නැව තුළ තබා ආකෘතිය නිර්මාණාත්මක ව අලංකාර කිරීමට සලස්වන්න.
- දෙවියන් වහන්සේ සමඟ සමීප ව දැහැමි ව ජීවත් වීම තුළ නෝවා ඇතුළු පවුලේ සැම දේව ආරක්ෂාව සැලැස්වූ බව අවධාරණය කරන්න.
- නෝවා මෙන් දැහැමි ව ජීවත් වීමට අප ද දෙවියන් වහන්සේ අපේක්ෂා කරන බව අවධාරණය කරන්න.

**තක්සේරුව :**

- දැහැමිකම මගින් නෝවා දේව රැකවරණය අත්දුටු කතන්දරය මතකයෙන් කියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ලොව වෙසෙන සැම දරුවකුට ම යහපත් ව ජීවත් වීමට හැකියාව දෙන ලෙස පවුලේ යාච්ඤාවේ දී යොමු වීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

නිපුණතාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

ඉගෙනුම් පල : 7.2

- ආබ්‍රහම් ලොත්ට කරුණාව දයාව දක්වමින් ක්‍රියා කළ ආකාරය ශුද්ධ බයිබලයෙන් කියවමින් එම සිදුවීම රංගනයක් මඟින් ඉදිරිපත් කරයි.

ඉගෙනුම් සම්පත් :

- ශුද්ධ බයිබලය (උත්පත්ති 13 : 8-12)
- කෙටි වාචික ප්‍රශ්න (බයිබල් කොටසේ සිදුවීමට අදාළ)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- කෙටි කතන්දරයක් ඇසුරින් පන්තියක සිසුන් දෙදෙනකු වාර අවසාන සංගීත ප්‍රායෝගික පරීක්ෂණයේ වයලින් වාදනය සඳහා තම පන්තියේ තත් කැඩුණු වයලීනයක් හිමි යහළුවාට තම හොඳ වයලීනය වාදනයට පරිත්‍යාග කිරීම
- මෙම කතන්දරයෙන් පරිත්‍යාගශීලී බව පෙන්නුම් කිරීම පිළිබඳ ව සිසු අදහස් විමසීම.

පියවර 2 :

- කතාව රඟ දැක්වීමට කැමති සිසුනට පෙර පුහුණුවක් ලබා දෙන්න.
- සිසුන් පන්තියෙන් පිටත එළිමහන් තැනකට රැගෙන යන්න.
- බයිබල් කොටස (උත්පත්ති 13 : 8 - 12) සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- පහත දැක්වෙන ආබ්‍රහම්ගේ ගති ලක්ෂණ මතු කරන්න.
  - * දයාව
  - * පරාර්ථකාමී බව
  - * කරුණාව
- ආබ්‍රහම් හා ලොත් අතර සිදුවීම රසවත් ව ඉදිරිපත් කරන්න.
- එම කතාවෙන් ඉදිරිපත් වන දේව ගති ලක්ෂණ මතු කරමින් රඟ දැක්වීමට සිසුන්ට අවකාශ සලස්වන්න.
  - * සැම දෙනා සමඟ ම පරාර්ථකාමී ව ජීවත් විය යුතු බව
  - * දෙවියන් වහන්සේ පරාර්ථකාමී ව ජීවත් වීමට අපට මඟ පෙන්වන බව

පියවර 3 :

- සිසුන් සමඟ පරාර්ථකාමී ව ජීවත් වීමට පිහිට ඉල්ලා යාච්ඤාවක් කරන්න.

**තක්සේරුව :**

- සුළු දේවල් සඳහා සහෝදර-සහෝදරියන්, මිතුරු-මිතුරියන් සමඟ ආත්මාර්ථකාමී ව ක්‍රියා කළ අවස්ථා හඳුනා ගනියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සැම කෙනකුට ම උදවු කරමින් පරාර්ථකාමී ව සිටීමට පිහිට ඉල්ලා යාච්ඤා කිරීමට යොමු වීම.

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.3

- ජෝෂුවා තම නායකත්වය තුළින් දේව කැමැත්ත ඉටු කළ බව පිළිගනිමින් කෙටි ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයයි.
- දේව කැමැත්තට කීකරු ව කටයුතු කිරීමට සිතා ගනිමින් කැප වීමේ යාච්ඤාවක් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ජෝෂුවා 6 : 1-6, 20)
- මාටින් ලූතර් කිං ගේ පින්තූරයක්
- කෙටි ප්‍රශ්න ලියූ කාඩ්පත්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- මාටින් ලූතර් කිං තුමාගේ පින්තූරයක් පෙන්වන්න.
- එතුමා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරන්න.
  - * ඇමරිකාවේ නීග්‍රෝවරුන්ගේ නායකයකු බව
  - * කළු සුදු භේදය නැති කිරීමට ක්‍රියා කළ බව
  - * සැම දෙනාට ම සම අයිතීන් ලබා දීමට සාමකාමී ව කටයුතු කළ බව
  - * මාටින් ලූතර් කිං තුමා දේව හඬට අවනත ව ක්‍රියා කළ නායකයකු බව

පියවර 2 :

- ජෝෂුවා තුමාගේ නායකත්වය ගැන කියැවෙන ජෝෂුවා 6 : 1-6, 20 පදය සිසුන්ට ඇසෙන සේ කියවන්න. පහත දැක්වෙන කරුණු ඉස්මතු කරන්න.
  - * ජෝෂුවා දේව හඬට සවන් දී ක්‍රියා කළ බව
  - * දෙවියන් වහන්සේට කීකරු වීමෙන් ජය අත් කර ගැනීමට හැකි වූ බව
  - * ජෝෂුවා තම නායකත්වය මඟින් දේව කැමැත්ත ජය ගත් බව සිසුන්ට පහදා දෙන්න.

පියවර 3 :

- ජෝෂුවා තම නායකත්වය ඉටු කළ ආකාරය ඉගෙන ගනිමින් කෙටි ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයයි.
  1. ජෝෂුවාට සවන් දෙන්නැයි කථා කළේ කවරෙක් ද ?
  2. ඉශ්‍රායෙල් ජනයා දේව ආරක්ෂාව සහිත ව සිටියේ කුමන නගරයේ ද ?
  3. දෙවියන් වහන්සේගේ හඬට අනුව ජෝෂුවා යුද්ධ භටයන්ට කුමක් කරන්නැයි කීවේ ද?
  4. හොරණෑ ශබ්දය හා ඔල්වරසන් හඬ මැද කුමක් සිදුවී ද ?
  5. ජෝෂුවා තුළ අප දකින හොඳ නායකත්වයේ ලක්ෂණය කුමක් ද ?

**තක්සේරුව :**

- කෙටි ප්‍රශ්න කිහිපයකට වාචික ව පිළිතුරු ලබා දෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව කැමැත්තට ඉටු කරමින් යහපත් නායකයකු සේ පන්ති කාමරයේ ක්‍රියා කිරීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.4

- දානියෙල් දෙවියන් වහන්සේ තුළ දේව ඇදහිල්ලෙන් සුරැකිතාව අත්දුටු බව පිළිගනිමින් එම සිදුවීම ප්‍රකාශ කරයි.
- දෙවියන් වහන්සේ සිංහ ගුහාවෙන් දානියෙල් මිදූ බව විශ්වාස කරමින් චිත්‍ර පෙළක් සාමූහික ව නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (දානියෙල් 6 : 10-23)
- $A_4$ කඩදාසි
- පාට කොළ
- නූල්, අඩියක කොටු 2ක්
- බයින්ඩර් ගම්
- දානියෙල් සිංහ ගුහාවේ සිටින පින්තූරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටින බව පවසමින් ප්‍රශංසාත්මක ගීතයක් ගායනා කිරීම.

 අදහමින් ගමන් කරමු
 අදහමින් සටන් කරමු
 අදහමින් ජය ගනිමු
 ජේසුස් පමණක් ජේසුස්

- මෙම ගීතය මඟින් දෙවියන් වහන්සේ තුළ ඇදහිල්ලෙන් ජීවත් වීම පිළිබඳ ව අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 2 :

- ශුද්ධ බයිබලයේ දානියෙල් 6 : 10 - 23 සිසුන්ට ඇසෙන පරිදි කියවමින් එම කොටස පැහැදිලි කරන්න.
  * දාරියුස් රජතුමාගේ ඇමතිවරයකු ලෙස දානියෙල් සේවය කළ බව
  * දිනකට තුන් වරක් ජෙරුසලම දෙසට හැරී යාච්ඤා කළ බව
  * දින 32ක් ඇතුළත රජුට මිස අන් කෙනෙකුට නමස්කාර කළහොත් සිංහ ගුහාවට හෙළන නියෝගයක් නිකුත් කර තිබූ බව
  * දානියෙල් සිංහ ගුහාවේ දෙවි පියාණන් වහන්සේට පමණක් නමස්කාර කරමින් යාච්ඤාවෙන් සිටි බව
  * දෙවියන් වහන්සේ දානියෙල් ආරක්ෂා කළේ ඔහු තුළ තිබූ ඇදහිල්ල නිසා බව

පියවර 3 :

- දානියෙල් සිංහ ගුහාවේ සිටින පින්තූරයක් සිසුන්ට පෙන්වමින් ඇදහිල්ලෙන් ගැලවීම ලැබූ බව පහදන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- $A_4$ කඩදාසි බෙදා දෙන්න.

- දෙවි පියාණන් වහන්සේ සිංහ ගුහාවෙන් දානියෙල් මිදූ බව විශ්වාස කරමින් චිත්‍ර පෙළක් සාමූහික ව නිර්මාණය කිරීමට සලස්වන්න.
- සිසුන්ට පෙනෙන ලෙස පන්ති කාමරයේ නූලක් ගැට ගසන්න.
- චිත්‍ර පෙළ නූලෙහි පිළිවෙළින් අලවන්න.

**තක්සේරුව :**

- දෙවියන් වහන්සේ සිංහ ගුහාවෙන් දානියෙල් මිදූ බව විශ්වාස කරමින් චිත්‍ර පෙළක් සාමූහික ව ඇඳ සම්පූර්ණ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පීඩා මැද දී වුවත් දෙවිඳුන් ගලවා ගන්නා බව අදහමින් ක්‍රියා කිරීමට යොමු වීම.

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.5

- ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ ක්‍රියාව මඟින් උන් වහන්සේගේ යටහත් පහත්කම පිළිගනිමින් එම සිදුවීම භූමිකා රංගනයෙන් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (ජොහාන් 13 : 4 - 9)
- තුවායක්
- වතුර භාජනයක්
- ජේසුතුමාට හා ගෝල පිරිසට අදාළ ඇඳුම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- ජේසුස් වහන්සේ හා ගෝලයන් අවසාන රාත්‍රි භෝජන සඳහා සහභාගි වීමේ අවස්ථාව දැක්වෙන පින්තූරයක් පෙන්වා එම කොටස සම්බන්ධ ව අවධානය යොමු කරවන්න.
- එදින ම සිදුවූ සිදුවීමක් අද ඉගෙන ගැනීමට යන බව පවසන්න.

පියවර 2 :
- ජොහාන් 13 : 4 - 9 සිසුන්ට ඇසෙන පරිදි කියවන්න. එම කොටසෙන් කියැවෙන ජේසුස් වහන්සේගේ යටහත් පහත්කමේ ක්‍රියාවලිය ගුරුතුමිය කළුලෑල්ලේ ලියා දක්වන්න.
  * රාත්‍රී භෝජනයෙන් පසු ව සිදු වූ බව,
  * ජේසුතුමා සළුව ගලවා තුවායක් ඉණ වටා බැඳගත් බව,
  * වතුර භාජනයක් ගත් බව,
  * තුවායෙන් පිස දැමීම සිදු කළ බව,
  * පේදුරු තුමා එය ප්‍රතික්ෂේප කළ බව,
  * ප්‍රතික්ෂේපය නිසා ජේසුස් වහන්සේ හා සබඳතාව බිඳී යන බව
- මෙම ක්‍රියාවලිය මඟින් ජේසුස් වහන්සේගේ යටහත් පහත් බව ඉස්මතු වූ බව සාකච්ඡා කරන්න.

පියවර 3 :
- පෙර සූදානම් කරගත් සේ භූමිකා රංගනයෙන් කතාව රඟදැක්වීමට සලස්වන්න. කතාවේ දැක්වෙන පහත දැක්වෙන කොටස් රඟ දක්වන්න.
  * ජේසුතුමා උතුරු සළුව ගලවා තුවායක් ඉණ වටා ඇඳගැනීම
  * ගෝලයන් සේ සිටින සිසුන් අඩකවයට අසුන් ගැන්වීම
  * ගුරුවරිය සිසුන්ගේ පාද සේදීම හා තුවාකඩින් පිස දැමීම

**තක්සේරුව :**

- ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ ක්‍රියාවලිය මඟින් උන් වහන්සේගේ යටහත් පහත්කම භූමිකා රංගනයෙන් සාමූහික ව ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සෑම දිනක ම සිදු කරන යටහත් පහත් ක්‍රියාවක් සම්බන්ධ ව පොතක් සැකසීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

**නිපුණතාව** : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.6

- ජේසුස් වහන්සේ කුරුසියේ දුක් විඳිමින් වුව ද කමාව දුන් බව වටහා ගනිමින් කමා වීමේ අගය දැක්වෙන ගීතයක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ලූක් 23 : 34)
- කුරුසිපත් ජේසුස් වහන්සේ දැක්වෙන පින්තූරයක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- කුරුසිපත් ජේසුතුමා පිළිබඳ පින්තූරය සිසුනට පෙන්වමින් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- පහත දැක්වෙන කරුණු ඉස්මතු කරන්න.
  * ජේසුස් වහන්සේ කුරුසියේ දී බොහෝ දුක් වින්ද බව
  * කස පහර, කෙළ පහර, කටු ඔටුන්නක් දමා දුක් වින්ද බව
  * ජේසුස් වහන්සේ තමාට පීඩා කළ අයට කමා වූ බව

පියවර 2 :

- කමාව පිළිබඳ කියැවෙන පහත දැක්වෙන ගීතය ගායනා කිරීම හෝ එවැනි වෙනත් ගීතයක්

කුරුසියේ දි දිවි පිදුවා
මා ගලවන්නට
ලේ දහරා ගලා ගියා
මා මුදවන්නට
මං ආදරෙයි ජේසු //

පියවර 3 :

- ජේසුතුමා කුරුසියේ දී දුක් විඳිමින් වුව ද කමා වූ බව කියැවෙන ලූක් 23 : 34 සිසුන්ට බයිබල් කොටස කියවන්න. එය පැහැදිලි කරන්න.
- ජේසුස් වහන්සේ දුක් කතාවේ වැදගත්කම ඉස්මතු කරන්න.
  * කමාව තුළ දේව ප්‍රේමය
  * දේව සැනසීම
  * දේව අනුග්‍රහය ලැබෙන බව
- එම අවස්ථාව චිත්‍රයට නැගීමට සලස්වන්න.

**තක්සේරුව :**

- ජේසුස් වහන්සේ කුරුසියේ දුක් විඳිමින් වුව ද කමාව දුන් බව වටහා ගනිමින් උන් වහන්සේගේ කුරුසිපත් වීම තමා කමා වීමේ අගය දැක්වෙන ගීතයක් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සැම විට ම අන් අයට කමා වීමට හැකියාව දෙන ලෙස ඉල්ලා දෙවි පියාණන්ට යාච්ඤා කිරීමට යොමු කිරීම.

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.1

- පැරණි හා නව වශයෙන් කොටස් දෙකකට බෙදුණ ද දේව වචනය අන්තර්ගත වන ශුද්ධ බයිබලය එක ම ශුද්ධ ග්‍රන්ථයක් බව පිළිගනිමින් එම කොටස් දෙකට අදාළ පොත් කිහිපයක් වර්ණවත් චාට් සටහනක් මඟින් ඉදිරිපත් කරයි.
- ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරමින් පැරණි හා නව ගිවිසුමට අයත් ශුද්ධ ලියවිලි පාඨය බැගින් ලියා කටපාඩම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (නව අනුවාදය - 2006)
- මුද්‍රිත චාට් සටහන්
- බ්‍රිස්ටල් බෝඩ් (විවිධ වර්ණවලින්)
- පාට පැන්සල්
- ප්ලැටිග්නම්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- ශුද්ධ බයිබලය පන්තියට ගෙන ගොස් සිසුන්ට එය නිරීක්ෂණය කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ඒ ඇසුරින් සරල සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පහත කරුණු ඉස්මතු කරවන්න.
  - * ශුද්ධ බයිබලය කිතුනුවන්ගේ ශුද්ධ ග්‍රන්ථය බව
  - * එහි දේව වචනය අන්තර්ගත වන බව
  - * එහි පොත් 66ක් ඇති බව
  - * එය පැරණි හා නව වශයෙන් කොටස් 2කට බෙදෙන බව
  - * විවිධ පොත්වර්ග එහි අඩංගු වන බව
  - * බයිබල් සමාගම බයිබල් මුද්‍රණය කරන බව
  - * විවිධ භාෂාවලට අද ශුද්ධ බයිබලය පරිවර්තනය වී ඇති බව
  - * අපගේ ජීවිතයට අවශ්‍ය සෑම මග පෙන්වීමක් ම ශුද්ධ බයිබලය මඟින් අපට ලැබෙන බව

පියවර 2 :

- පැරණි හා නව ගිවිසුම ලෙස කොටස් 2කට බෙදූ චාට් සටහනක ආකෘතිය බැගින් සිසුන්ට බෙදා දෙන්න.
- එහි අංග 2 සඳහා ශුද්ධ බයිබලයේ කැමති පොත් 5 බැගින් විවිධ වර්ණයේ පාට පැන්සල් භාවිතයෙන් සටහන් කිරීමට ඉඩ සලසන්න.
- සෑම සිසුවකුගේ ම චාට් සටහන අගය කරන්න.

පියවර 3 :

- සිසුන් කණ්ඩායම්ගත කරන්න. නැතහොත් පන්තියේ සිටින සිසුන් තනි තනි ව සම්බන්ධ කර ගන්න.
- වර්ණ කිහිපයකින් බ්‍රිස්ටල් බෝඩ් එකක් බැගින් හා ප්ලැටිග්නම් ලබා දෙන්න.
- ශුද්ධ බයිබලයේ පැරණි හා නව ගිවිසුම නියෝජනය වන පරිදි සරල ශුද්ධ ලියවිලි පාඨය බැගින් (කණ්ඩායමකට එක බැගින් හෝ එක් එක් සිසුවාට/සිසුවියට) සපයා දෙන්න.

- ලද ශුද්ධ ලියවිලි පාඨය විවිධ පාට යොදා සිසුවකුට එක් වදන බැගින් හෝ කැමති අයුරින් හෝ බ්‍රිස්ටල් කඩදාසියේ සටහන් කිරීමට මඟ පෙන්වන්න.
- එය කට පාඩම් කර ගැනීමට සැම සිසුවකුට ම අවස්ථාව සලසන්න.
- ඉන් පසු ක්‍රීඩාවක ආකාරයට කණ්ඩායමේ එක් සිසුවකු පන්තියට බ්‍රිස්ටල් කඩදාසියේ ලියූ ශුද්ධ ලියවිලි පාඨය ප්‍රදර්ශනය කරන අතර කණ්ඩායමේ අනෙක් සිසුන්ට පන්තියට පිටුපා එය මතකයෙන් කීමට අවස්ථාව ලබා දෙන්න.
- සැම සිසුවකු ම ශුද්ධ ලියවිලි පාඨය මතකයෙන් පැවසූ පසු අත්පොළසන් නාදයක් දී ඔවුන් අගය කරන්න.
- සිසුන් හා එක් ව දේව වදනට අනුව දිවි ගෙවීමට මඟ පෙන්වීම අයැදිමින් යාච්ඤාවේ නිරත වන්න.

**තක්සේරුව :**

- සරල ශුද්ධ ලියවිලි පාඨයක් මතකයෙන් පවසයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දින පතා සරල ශුද්ධ ලියවිලි පාඨයක් කියවීමට යොමු කිරීම.

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.2

- එකිනෙකා කළ වැරදි අමතක කර, නිරතුරුව කමාව දීමේ දේව ගුණය වර්ධනය කර ගනිමින් ජෝසෙප් හා සහෝදරයන් හමු වී එකිනෙකාට සමාව දුන් සිදුවීම භූමිකා රංගනයක් මඟින් ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් සම්පත්** : • ශුද්ධ බයිබලය (නව අනුවාදය) (උත්පත්ති 50 : 15-21)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිසුන් පන්ති කාමරයෙන් පිටත පරිසරයට රැගෙන යන්න.
- ශුද්ධ බයිබලයේ උත්පත්ති 50 : 15-21 දක්වා කොටස සිසුන්ට ඇසෙන පරිදි කියවන්න.
- ජෝසෙප් සිය සහෝදරයන් හමු වී ඔවුන්ට කමාව දුන් සිදුවීම ශුද්ධ බයිබල් පාඨයට අනුව රසවත් ව ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
  - * ජෙකොබ් මියගිය පසු ජෝසෙප් ඉදිරියට යාමට සහෝදරයන් බිය වූ බව
  - * ඔවුන් කමාව අයැදිමින් ජෝසෙප් වෙත පණිවිඩයක් යැවූ බව
  - * තමන් සහෝදරයන් ලෙසට නොව දාසයන් වශයෙන් පිළිගන්නා ලෙස ඔවුන් ජෝසෙප්ගෙන් අයැද සිටි බව
  - * ඒ ඇසූ ජෝසෙප් දුකින් හැඬූ බව
  - * සහෝදරයන් ඔහු වෙත ගොස් ඔහු ඉදිරියෙහි වැඳ වැටුණු බව
  - * ජෝසෙප් ඔවුන්ට කමාව දී කාරුණික ව කතා කරමින් ඔවුන් පිළිගත් බව
  - * ඔවුන් සියලු දෙනා පෝෂණය කොට රැකබලා ගැනීමේ වගකීම ජෝසෙප් භාරගත් බව
  - * අන් අයගේ වැරදි අමතක කර නිරතුරු ව ම කමාව දීමේ දේව ගුණය වර්ධනය කරගත යුතු බව

පියවර 2 :
- ජෝසෙප් සහෝදරයන් හමු වී ඔවුන් පිළිගෙන කමාව දුන් සිදුවීම භූමිකා රංගනයක් මඟින් ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න.

පියවර 3 :
- සිසුන් අන් අයට කමාව දී ඇති අවස්ථා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- අන් අයට කමාව දී කාරුණික ව සැලැකීමේ වැදගත්කම අවධාරණය කරන්න.

**තක්සේරුව :**

- ජෝසෙප් සහෝදරයන්ට කමාව දුන් අයුරු භූමිකා රංගනයකින් ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- වැරදි කරන අයට කමාව දී කාරුණික ව සැලකීම

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : **ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.**

**ඉගෙනුම් පල** : 8.3

- ජීවිත අභියෝග හමුවේ පවා දෙවියන් වහන්සේ තුළ ආදර්ශවත් ජීවිත ගත කළ යුතු බව පිළිගනිමින් ස්තේපන් සිය මරණ අවස්ථාවේ ඉදිරිපත් කළ කමාව දීමේ යැදුම ශුද්ධ බයිබලයෙන් සොයා සටහන් කරයි.
- ස්තේපන්ට ගල් ගසන අවස්ථාවේ දේව ගුණාංග විදහා දක්වමින් ඔහු ක්‍රියා කළ ආකාරය අගය කර, එම අවස්ථාව මඟින් චරිතායනය කළ හැකි යහපත් කිතුනු ගුණාංග 2ක් ලියා සරසයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (නව අනුවාදය 2006) (ක්‍රියා 7 : 59 -60)
- ජුදෙව් මිනිසකුගේ අත් රූකඩයක්
- බ්‍රිස්ටල් බෝඩ්
- පරිප්පු/මුං ඇට/වැලි/සියුම් ගල්
- ගම්
- පාට පැන්සල්

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :

- සිසුන්ට පහසු ලෙස අසුන් ගැනීමට සලස්වන්න.
- ක්‍රියා 7 : 59-60 සිසුන්ට ඇසෙන සේ ශුද්ධ බයිබලයෙන් කියවන්න.
- ගුරුතුමා/ගුරුතුමිය ජුදෙව් මිනිසකුගේ අත්රූකඩය පැලැඳගන්න.
- ආකර්ෂණීය අයුරින් ස්තේපන්ගේ කතාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
- පහත කරුණු අවධාරණය කරන්න.
  - * ජේසුස් වහන්සේට යාච්ඤා කරද්දී සෙනඟ ස්තේපන්ට ගල් ගැසූ බව
  - * මහත් හඬින් මොර ගසමින් ස්තේපන් තමාට ගල් ගැසූ අයට කමාව දුන් බව
  - * කමාව අයැදීමෙන් පසු ඔහු මිය ගිය බව
  - * පීඩාවට මුහුණ දෙන අතර, පීඩා කරන්නන්ට කමාව දීම උදාර දේව ගුණාංගයක් බව
  - * ජේසුස් වහන්සේගේ ආදර්ශය අනුගමනය කළ ස්තේපන් මෙන් අප ද අපට පීඩා කරන අයට කමාව දීමට පසුබට නොවිය යුතු බව

පියවර 2 :

- 'සමිඳාණන් වහන්ස මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව' යන ස්තේපන්ගේ යැදුම ශුද්ධ බයිබලයෙන් සොයා සටහන් පොතේ රචනා කිරීමට මඟ පෙන්වන්න.

පියවර 3 :

- ස්තේපන්ගේ කතාවට අයත් සරල ප්‍රශ්න කීපයකට වාචික ව පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්තේපන්ගේ ජීවිතයෙන් චරිතායනය කළ හැකි ගුණාංග පිළිබඳ ව විමසන්න.
- සිසුන් කණ්ඩායම් ගත කොට එම ගුණාංගයක් (කමාව/නිර්භීත බව/දයාව/යැදීම) බැගින් විශාල ලෙස ලියන ලද බ්‍රිස්ටල් කඩදාසිය බැගින් කණ්ඩායම් දෙක වෙත වෙන වෙන ම ලබා දෙන්න.

- පරිප්පු/මුං ඇට/වැලි/සියුම් ගල් ආශ්‍රයයෙන් එම ගුණාංගය ලියූ කඩදාසිය (ගුණාංගයේ අකුරු මත) සැරසීමට උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමක ම කාර්යය අගය කරන්න.

**තක්සේරුව :**

- ස්තේපන්ගේ ජීවිතයෙන් විදහා දැක්වුණු කිතුනු ගුණාංගයක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පීඩා කරන අය පිළිබඳ ව දෙවිඳුන්ට යාච්ඤා කිරීම.

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**නිපුණතාව** : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.4

- දින පතා බයිබලය කියවා යාච්ඤා කළ යුතු බව අවබෝධ කර ගනියි.
- දින පතා කියවන බයිබල් පද අභ්‍යාස පොතේ සටහන් කර ගනිමින්, ජීවිතයට මඟ පෙන්වීමක් ලබා ගනියි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය - 2 (තිමොති 3 : 15 - 16)
- ක්‍රිස්තියානි සිංහල ගීතිකා පොතේ ගීතිකා අංක 211 ''ඔබේ දෙව් වදන්'' ගීතයේ පළමු පදය ලියූ පුවරුවක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පියවර 1 :
- සිත් ඇදගන්නා ලෙසට අලංකාර ව සකස් කළ ගීතය ලියූ පුවරුව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

  ''ඔබේ දෙව් වදන් දිවගට - මිහිරි රසය මුසු කරයි
  
  කරුණාබර මොළොක් වදන් - අප මුවගට එක් කරයි
  
  ගෙනෙයි වාසනා - දිවියට ගෙනෙයි වාසනා ''
- ගීතය සිසුන් සමඟ තාලයට ගායනා කරන්න.
- ගීතයේ සඳහන් කරුණු ගැන සිසුන්ගෙන් විමසන්න.
  - * දේව වචනය ජීවිතයට අත්වැලක් බව
  - * දේව වචනයේ අගය එම ගීතයේ සඳහන් බව

පියවර 2 :
- ශුද්ධ බයිබලයේ 2 තිමොති 3 : 15 - 16 බයිබල් පාඨය සිසුන්ට ඇසෙන සේ ශබ්ද නඟා කියවන්න.
- එහි සඳහන් කරුණු සාකච්ඡා කරමින් හුනු පුවරුවේ සටහන් කරන්න.
- ළමා වියේ සිට ශුද්ධ ලියවිල්ල දැන ගත යුතු බව
- ශුද්ධ ලියවිලි කියවීමෙන් කිතුනු ඇදහිල්ල වර්ධනය වන බව
- දේව කැමැත්තට අනුකූලව ජීවත් වීමට ඉන් ඉගෙන ගත හැකි වීම
- දින පතා බයිබලය කියවා යාච්ඤා කිරීමෙන් ජීවිතයට දේව මඟ පෙන්වීම ලැබෙන බව
- ශුද්ධ ලියවිල්ල දේව මඟ පෙන්වීම ඇතිව ලියවී ඇති බව

පියවර 3 :
- ඉතා මනහර ලෙසට සරසන ලද කුඩා අභ්‍යාස පොත් සිසුන්ට ලබා දෙන්න.
- දිනය සටහන් කර, එදින ඉගෙන ගත් බයිබල් පාඨය සඳහන් ස්ථානය අභ්‍යාස පොතේ ලිවීමට සිසුන් යොමු කරවන්න.
- දේව වචනය ගැන ස්තුති කරමින් කෙටි යාච්ඤාවක් පුදන්නට සිසුවකුට පවරන්න.

**තක්සේරුව :**
- දිනට කියවූ බයිබල් පදය/ස්ථානය අභ්‍යාස පොතේ සටහන් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**
- දින පතා බයිබලය කියවා යාච්ඤා කර, අභ්‍යාස පොතේ ඒ පිළිබඳ ව සටහනක් තැබීමට හුරු කරවීම

# ක්‍රිස්තියානි ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | | | සිසුන් ගේ නම් <br> තක්සේරු කිරීමේ පරිමාණ <br> සාර්ථක ව කරයි <br> දුෂ්කරතා පෙන්නුම් කරයි <br> තවදුරටත් උදවු අවශ්‍ය ය. • |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1. දෙවියන් වහන්සේ ලෝකය මැවීම ගැන අගයමින් මැවිලි ගැන පසසමින් තුති පුදමින් යාච්ඤා කරයි. |
| | | | | | | 2. තමා අසල්වැසියන්ට හෝ ඥාතීන්ට හෝ උදවු කළ කළ අවස්ථාවක් චිත්‍රයට නගයි. |
| | | | | | | 3. දෙවි පියාණන් වහන්සේ අපට රැකවරණය ලබා දෙන බව ප්‍රකාශ කරයි. තුති පුදමින් යාච්ඤා කරයි. |
| | | | | | | 4. දෙවියන් වහන්සේ පාළුකරයේ ගමන් කළ ඉශ්‍රායෙල් ජනතාව ප්‍රාතිහාර්යාත්මක ව මන්නා හා වටුවන් මඟින් පෝෂණය කළ සිද්ධිය ආශ්‍රිත ව වාචික ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයයි. |
| | | | | | | 5. තම ජීවිතයට ගුරුවරුන්ගෙන් හා දේව සේවකයන්ගෙන් ලැබුණු මග පෙන්වීම ලබා ගැනීමේ වැදගත්කම පිළිගනිමින් එවැනි අත්දැකීම් ප්‍රකාශ කරයි. |
| | | | | | | 6. සාම කුමරුන් ලොවට ගෙනා සාම පණිවිඩය ප්‍රකාශ වන නත්තල් පතක් නිර්මාණය කරයි. |
| | | | | | | 7. බයිබල් පාඨය ලියූ වර්ණවත් පොත් සලකුණක් නිර්මාණය කරයි. |
| | | | | | | 8. ජේසුස් වහන්සේ රජකු සේ ජෙරුසලමට පිවිසීමේ සිදුවීම රංගනයකින් ඉදිරිපත් කරයි. |
| | | | | | | 9. හඬ නඟා සාමූහික ව යාච්ඤාවේ යෙදෙයි. |
| | | | | | | 10. දේවස්ථානයේ තමන්ගේ මිතුරු-මිතුරියන් පිළිබඳ ව යාච්ඤා කරයි. |
| | | | | | | 11. ඉවසීම, කරුණාව හා යහපත්කම යන ශුද්ධාත්ම පල තමා තුළ ඉස්මතු වූ අවස්ථා පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරයි. |
| | | | | | | 12. දූහැමිකම නිසා නෝවා දේව රැකවරණය අත්දුටු කතන්දරය මතකයෙන් කියයි. |
| | | | | | | 13. සුළු දේවල් සඳහා සහෝදර/සහෝදරියන්, මිතුරු/මිතුරියන් සමඟ ආත්මාර්ථකාමී ව ක්‍රියා කළ අවස්ථා හඳුනා ගනියි. |
| | | | | | | 14. වාචික ව කෙටි ප්‍රශ්න කිහිපයකට පිළිතුරු ලබා දෙයි. |
| | | | | | | 15. දෙවියන් වහන්සේ සිංහ ගුහාවෙන් දානියෙල් මිදූ බව විශ්වාස කරමින් චිත්‍ර පෙළක් සාමූහික ව ඇඳ සම්පූර්ණ කරයි. |
| | | | | | | 16. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමේ ක්‍රියාවලිය තුළින් උන් වහන්සේගේ යටහත් පහත්කම භූමිකා රංගනයෙන් සාමූහික ව ඉදිරිපත් කරයි. |
| | | | | | | 17. ජේසුස් වහන්සේ කුරුසියේ දුක් විඳිමින් වුව ද කථාව දුන් බව වටහා ගනිමින් උන් වහන්සේ කුරුසිපත් වීම/කමා වීමේ අගය දක්වෙන ගීතයක් ගායනා කරයි. |
| | | | | | | 18. සරල ශුද්ධ ලියවිලි පාඨයක් මතකයෙන් පවසයි. |
| | | | | | | 19. ජෝසෙප් සහෝදරයන්ට කමාව දුන් අයුරු භූමිකා රංගනයකින් ඉදිරිපත් කරයි. |
| | | | | | | 20. ස්තේපන්ගේ ජීවිතයෙන් විදහා දක්වුණු කිතුනු ගුණාංගයක් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි. |